2020.10.24 දිනමිණ පිටුව 2

# 15 වැනි ජන සංගණනය පැවැත්වීමට සියලු කටයුතු සූදානම්

## ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**නුවන් හෙට්ටිආරච්චි**

2021 වර්ෂයේ 15 වැනි ජන සංගණනය පැවැත්වීමට සියලු කටයුතු සූදානම් බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අයි. ආර්.බණ්ඩාර මහත්මිය දිනමිණට ඊයේ (23) පැවසීය.

අවසන් වරට 2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජන සංගණනය සිදු කර ඇති අතර නමුත් එම සංගණනය තැබීමට තිබී ඇත්තේ 2011 වර්ෂයේ බව සඳහන් කරන බණ්ඩාර මහත්මිය අවුරුදු දහයෙන් දහයට මෙම ජන සංගණනය අප රට තුළ පවත්වන බවත් එම සෑම අවුරුද්දක්ම ඔත්තේ අගයක් හෙවත් එකේ ඉලක්කමක් ආවසානයට යෙදෙන බවත් පැවසීය.

නමුත් 2012 වර්ෂයේ හදිසි හේතුවක් මත ජන සංගණනය පැවැත්වීමට සිදු වූ බවත් නමුත් ඉදිරියට එසේ නොවනු ඇතැයි විශ්වාස කරන් බවත් හෙතෙම දිනමිණට කිවේය.